# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2017

## කම්කරු නීතිය

## පැ තුනයි (03)

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07**

ප්‍රශ්න <u>හතරකට</u> (04) පමණක් පිළිතුරු සපයන්න.
**(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)**

---

1. රැකියා සබඳතාව නිර්වචනය කළ යුතු වන්නේ එකී සබඳතාවයේ අඩංගු ආර්ථික යථාර්ථයන් සැලකිල්ලට ගෙන මිසක රැකියාවේ තාක්ෂණ සංකල්ප දෙස විමසිලිමත් වීමෙන් නොවේ. රැකියාවට අදාළ සියලුම කරුණු මත පිහිටා අධිකරණය ක්‍රියාත්මක වන විට රැකියා සබඳතාවට අදාළව දෙමුහුන් පරීක්ෂණයක් අධිකරණය විසින් උපයෝගී කරගත් බව පැවසේ.

   (Dawn D. Bennett–Alexander and Lawra B. Pincus , Employment Law for Business P.42)

   ඔබ එකඟ වන්නේද?

   යම්කිසි තැනැත්තෙක් රැකියා සබඳතාවක් යටතේ ශ්‍රමය සපයන්නේ දැයි තිරණය කිරීම පිණිස අධිකරණය විසින් සපයා ඇති විවිධ වූ අර්ථනිරූපන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පැහැදැලි කරන්න.

2. (අ) ශ්‍රී ලංකා ව්‍යවසායකයන්ගේ සංසදය මගින් සංවිධානය කරනු ලබන රැකියා සල්පිලකදී **"ශ්‍රී ලංකාවේ විවිධ වූ රැකියා ක්ෂේත්‍රයන්ට අදාළ නෛතික රාමුව"** යන තේමාව යටතේ දේශනයක් පැවැත්වීම සඳහා ඔබ සම්පත්දායකයෙක් වශයෙන් හඳුනාගෙන ඇත. උක්ත තේමාව යටතේ ඔබ විසින් ඉදිරිපත් කිරීමට නියමිත දේශනයට අදළ ලේඛණය ලියා දක්වන්න.

අ.පි.බ.

(ආ) පහත දැක්වෙන ප්‍රකාශ ඇසුරෙන් ජනිත වන නෛතික ආනුෂාංග පැහැදිලි කරන්න:

(i) රාජ්‍ය අධිකාරියක් සහ පෞද්ගලික වාණිජ සමාගමක් අතර තැනක රාජ්‍ය සංස්ථාවක් ස්ථානගත වී ඇත.

(ii) රාජ්‍ය නිලධාරීහු කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ සහ ජනාධිපතිවරයාගේ ප්‍රසාදය මත සිය තනතුරු දරති.

(iii) ශ්‍රී ලංකාවේ පවත්නා කම්කරු නීති ක්‍රමය තුළ ගෘහස්ථ ක්ෂේත්‍රයේ ශ්‍රමිකයින් කිසිදු අයුරකින් ආරක්ෂා කර නැත.

3. (අ) <u>රාජ්‍ය ස්කාගාර සංස්ථාව</u> එ. <u>ජැක්සන් රූපසිංහ</u> [(1994) 2 Sri L.R. P. 396] නඩු තීන්දුව වූ කලී ශ්‍රී ලංකාවේ පරිවාසික සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීමට දායක වූ සුවිශේෂී නඩු තීන්දුවකි.

ඔබ එකඟද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) සී/ස පූගොඩ බතික් සමාගම 2012 දී සහකාර අලෙවි නිලධාරියෙක් ලෙස රවී සේවයේ නියුක්ත කළේය. අලෙවි ප්‍රවර්ධනය වෙනුවෙන් සමාගම රවීට පුහුණුවක් ලබාදුන් අතර ඔහුගේ දෛනික වැටුපද වැඩි කළේය. අනතුරුව තරුපහේ හෝටලයක පිහිටා තිබූ තම සමාගමට අයත් අලෙවි ශාඛාවක් භාර නිලධාරියා ලෙස රවී පත් කළ හෙයින් සතියේ දින හයක් ඔහුට සේවයේ නිරත වීමට සිදුවිය. රු. 1300/= වූ ඔහුගේ දෛනික වැටුප දෙසතියකට වරක් එම කාලසීමාවේදී සේවය සැපයූ දින ගණනට අනුව රවීට ගෙවා තිබුනි. රවීට ණය පහසුකමක් ලබා ගැනීමට 2015 දී සමාගම විසින් සැපයූ සේවා ලිපියේ "අනියම් සේවකයෙක් ලෙස.......සිට රවී මෙම සමාගමේ සේවය කරයි" යනුවෙන් සඳහන් වී තිබුණ අතර රවී එම ලිපිය කිසිදු විරෝධයකින් තොරව පිළිගත්තේය. සමාගම සහ රවී සමග ඇති වූ ආරාවුලක් නිසා සමාගම විසින් 2017 ජුනි මස රවීගේ සේවය අවසන් කරමින් "ඔබගේ අනියම් සේවය/ තවදුරටත් සමාගමට අවශ්‍ය නොවේ" යනුවෙන් සඳහන් කළේය. තම රැකියාව අනියම් ස්වභාවයේ රැකියාවක් ද, නැතහොත් ස්ථිර ස්වභාවයේ රැකියාවක් දැයි දැන ගැනීමට ඔහුට අවශ්‍ය වී ඇත.

රවීට උපදෙස් දෙන්න.

අ.පි.බ.

4. හොරයිසන් බැංකුවේ විධායක නිලධාරියෙක් ලෙස දේවා වසර පහළොවක සිට සේවයේ නිරතව සිටි අතර වංකභාවය සහ විශ්වාසය අහිමිවීම යන සාධක පදනම් කර ගනිමින් ගෘහස්ත පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව බැංකුව විසින් දේවාගේ රැකියාව අවසන් කරන ලදි. සේවා ගිවිසුමේ අඩංගු වූ වගන්තියකට පටහැනි ලෙස කටයුතු කර තිබීම මත ඉදිරිපත් කර තිබූ චෝදනා සනාථ වූ බැවින් දේවා රැකියාවෙන් නෙරපා හැරීම උචිත බව බැංකුවේ මතය වී ඇත. සේවා ගිවිසුමේ සඳහන් වගන්තියක මෙසේ සඳහන් වේ:

"ඔබ වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට පූර්ණ කාලීනව කැපවිය යුතු අතර සේවකයින් හට මඟ පෙන්වීමට සහ ඔවුන් විසින් අවශ්‍යයෙන්ම අනුගත වීම සඳහා කලින් කලට බැංකුව විසින් නිකුත් කරනු ලබන රීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අපූර්ව අනුමැතියක් නොමැතිව කිසිදු සේවකයෙක් සිය රැකියාවට සමාන්තර ලාභදායි රැකියාවක/ වෘත්තීයක හෝ ව්‍යාපාරයක නිරත නොවිය යුතු ය."

චෝදනා පත්‍රයේ පහත සඳහන් චෝදනා අඩංගු වී තිබුනි:

(i) ගිවිසුමේ සඳහන් උක්ත වගන්තිය උල්ලංඝනය කරමින් දේවා ශ්‍රී ලක්ෂමී එක්ස්චේන්ජ් නමින් ව්‍යාපාරයක් සිය බිරිඳ ගේ නමින් ලියාපදිංචි කර පවත්වාගෙන යෑම සහ රජය/ රාජ්‍ය සංස්ථා විසින් නිකුත් කෙරෙන චෙක්පත් සහ පසුදාතමින් නිකුත් කළ චෙක්පත් නිෂ්කාශනය කිරීමේ අරමුණ ඇතිව එකී ව්‍යාපාරය පවත්වා ගෙන ගිය බවත්;

(ii) ඔහු විසින් චෙක්පත් නිෂ්කාශණයට පෙර බැංකුවේ පාරිභෝගිකයන්ගේ ගිණුම්වටලට අදාළ රහස්‍ය තොරතුරුවලට පිවිසීම සඳහා ඔහු බැංකුවේ දැරූ තනතුර උපයෝගී කර ගැනීම මගින් බැංකුව සතු පාරිභෝගික බැංකු ගිණුම්වලට අදාළ රහස්‍යභාවය උල්ලංඝණය කිරීමත්, ශ්‍රී ලක්ෂමී එක්ස්චේන්ජ් හි සේවකයෙක් සමඟ නිරන්තරයෙන් පවත්වනු ලැබූ දුරකථන සංවාද ඔස්සේ මෙම චෝදනාට අදාළ සාක්ෂි තහවුරු කර ගැනීමට හැකි වූ බවත්, උක්ත ව්‍යාපාරය ඔහුගේ බිරිඳට අයත් වුවත් ඇයට මූල්‍ය ගනුදෙනු පිළිබඳව හෝ බැංකු කටයුතු පිළිබඳව කිසිදු දැනුමක් නොතිබූ හුදු ගෘහනියක් පමණක් බවට කරුණු අනාවරණය වූ බවත්;

(iii) චෙක්පත් නිෂ්කාශන තුළින් විශාල කොමිස් මුදල් උපයා ගැනීමට සමත්වීම සහ එමගින් බැංකුවේ ව්‍යාපාරික කටයුතු සමඟ සමපාත වන කටයුතු වල නිරත වීම මගින් ළබැඳියාවන් අතර ගැටුමක් හටගත් බවත් එමගින් අදාළ සේවකයා වංක ලෙස කටයුතු කර ඇති අතර ඔහු කෙරෙහි බැංකුව තැබූ විශ්වසනීයත්වය කඩ කළ බවත් කියා සිටී. අ.පි.බ.

ගෘහස්ථ පරීක්ෂණයේදී දේවා පහත කරුණු මත සිය තර්ක පදනම් කළේය:

(i) ශ්‍රී ලක්ෂ්මි එක්ස්චේන්ජ් යනු ඔහුගේ ව්‍යාපාරයක් නොවන බව සහ එමගින් ණය සැපයීම් සිදු නොකළ බවත් ;

(ii) සේවා ගිවිසුමේ සඳහන් වගන්තියෙන් තම සාමාන්‍ය නිල කාර්යාලීය කාල සීමාවෙන් පිටතදී වෙනත් ව්‍යාපාරයක යෙදීම අවහිර කර නැති බවත්;

(iii) වෙනත් ලාභදායී රැකියාවක නිරත නොවන බවට ප්‍රකාශයක් ලබා දීමට උපදෙස් නිකුත් කළ චක්‍රලේඛය මගින් එබඳු ව්‍යාපාරයක නියැලී සිටියේ නම් එය නවතා ඉන් ඉවත් විය යුතු වූ දිනය කුමක්දැයි සඳහන් වී නොතිබූ බවත්;

(iv) ගෘහස්ථ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ චෝදනා පත්‍රයේ රහස්‍ය භාවය කඩ කිරීම චෝදනාවක් ලෙස ඉදිරිපත් නොකල බවත්;

හොරයිසන් බැංකුවේ සේවක වෘත්තික සමිතිය දේවාගේ රැකායාව අවසන් කිරීමට එරෙහිව කම්කරු විනිශ්චය සභාවට ඉල්ලුම් පත්‍රයක් යොමු කළේය. පහත දැක්වෙන කරුණු සාකච්ඡා කරන්න:

(අ) කුමන පදනමක් යටතේ වෘත්තිය සමිතියට දේවා වෙනුවෙන් එකී ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ හැකි වේද?

(ආ) රැකියා අවසන් කිරීමට එරෙහිව එකී ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සහ වරින් වර සංශෝධිත 1950 අංක 43 දරණ කාර්මික ආරාවුල් පනත යටතේ ඊට අදාළ ප්‍රතිපාදන කවරේදැයි සඳහන් කරන්න.

(ඇ) ඔබ කම්කරු විනිශ්චය සභාවේ සභාපති නම් නිකුත් කරනු ලබන නියෝගය කවරේ ද?

(ඈ) එකී විනිශ්චය සභාවේ සභාපති වශයෙන් සේවා ගිවිසුමේ අඩංගු උක්ත වගන්තියෙන් ඔබ බැඳී සිටින්නේදැයි පැහැදිලි කරන්න.

05. පහත දැක්වෙන ව්‍යවස්ථාවන්හි අඩංගු ප්‍රතිපාදනයක්/ප්‍රතිපාදන හේතුකොට ගෙන උද්ගත වී ඇති අපැහැදිලිතාවක් හඳුනාගෙන අධිකරණමය අර්ථ නිරූපණ තුළින් එකී අපැහැදිලිතාව බැහැර කිරීම පිණිස අධිකරණය කෙසේ මැදිහත් වී ඇත්දැයි නිදර්ශන සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් පැහැදිලි කරන්න:

(i) වරින් වර සංශෝධිත 1950 අංක 43 දරණ කාර්මික ආරාවුල් පනත;

අ.පි.බ.

(ii) වරින් වර සංශෝධිත 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත;

(iii) වරින් වර සංශෝධිත 1971 අංක 45 දරණ කම්කරුවන්ගේ රැකියාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන පනත).

06. "කාර්මික සබඳතාවන්ට අනුරූප නිත්‍යානුකූල කාර්යභාර ඉටුකිරීමේදී වෘත්තීය සමිතිවල ක්‍රියාකාරීත්වය සීමා කිරීමට සමත් වන පරිදි පොදු නීතිය තුළින් උද්ගතකරනු ලබන වගකීම් සමුදායෙන් එකී සමිතිවලට ආරක්ෂාවක් හිමිවිය යුතුය. එය 1935 සිටම වෘත්තීය සමිතිවලට අදාළ ව්‍යවස්ථාපිත නීතිය තුළ අඩංගු අරමුණු අතර එක් වැදගත් අරමුණක් වී ඇත. එනමුදු එකී මුක්තීන් වූ කලී වෘත්තීය සමිතිවලට ඕනෑම දෙයක් කිරීම සඳහා ලබාදී ඇති බලපත්‍රයක් නොවන අතර ඒවා වෘත්තීය සමිතිවලට අදාළ නිත්‍යානුකූල ක්‍රියාකාරකම්හි නියැලීම පිණිස සපයා දී ඇති ආරක්ෂිත ආවරණයක් පමණි."

උක්ත ප්‍රකාශය හොඳින් කියවීමෙන් අනතුරුව පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න:

(i) වෘත්තීය සමිතිවල ඵලදායි කම්කරු ක්‍රියාකාරකම් සීමාකිරීමට සමත්වන පරිදි පොදු නීතිය තුළ මැනවින් ස්ථාපනය වී ඇති නෛතික වගකීම් පැවරෙන අවස්ථා කවරේදැයි නිදර්ශන සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) වරින්වර සංශෝධිත 1935 අංක 14 දරණ වෘත්තීය සමිති ආඥා පනතෙන් වෘත්තීය සමිතිවලට සපයා දී ඇති ආරක්ෂිත රැකවරණයේ ස්වභාවය සහ එහි ක්ෂේත්‍රපථය පැහැදිලි කරන්න;

(iii) වෘත්තීය සමිතිවල ක්‍රියාකාරකම් අවහිරකිරීමට සමත්වන සීමාවන් වේ නම් ඒවා කවරේදැයි සඳහන් කරන්න.

07. (අ) අන්තර්ජාතික කම්කරු සංවිධානය විසින් පනවා ඇති ළමා ශ්‍රමයට අදාළ මූලික සම්මුතීන් මගින් ආර්ථිකමය ශ්‍රම සූරාකෑමට ලක්වන ළමුන් කෙතෙක් දුරට ආරක්ෂා කෙරෙන්නේදැයි සාකච්ඡා කරන්න.

(ආ) අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අංක 111 දරණ වෙනස්කම් කිරීම (රැකියා හා වෘත්තීන් තුළ) පිළිබඳ සම්මුතිය යටතේ පැනවී ඇති ප්‍රමිතීන් සමග ශ්‍රී ලංකාවේ මෙය ඇසුරෙන් පැනවී ඇති ප්‍රමිතීන් කොතෙක් දුරට ගැලපෙන්නේ දැයි සාකච්ඡා කරන්න.

○○○○○○○○○○○○○○